**සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව, කම්කරු දෙපාර්තමේන්තුව හා සේවා ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලේ සාමාජික විස්තර අඩංගු දත්ත ගබඩාවන්හි පවතින විෂමතා මගහරවා ගැනීම් වස් සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) සියළුම සාමාජිකයින්ව, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත (ජා.හැ.) අනුව එහි අංකය ගිණුම් අංකය ලෙස ලබා දෙමින් ඔවුන්ව නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව දියත් කෙරේ. තවද, මේ මගින් මෙම වැඩපිළිවෙල යටතේ සාමාජිකයා සතු සියළුම පූර්ව සේවා සාමාජික ගිණුම් ඒකාබද්ධ කෙරෙනු ලැබේ.

සාමාජික ප්‍රතිලාභ ප්‍රදානය කිරීමේ වැඩ කටයුතු වේගවත් කරවීම, වංචාකාරී ලෙස සාමාජික ප්‍රතිලාභ ලබා ගැනීම් අවම කිරීම, ප්‍රතිලාභ ගෙවීම් නීත්‍යානුකූල පාර්ශවයන්ට ලැබීම සාක්ෂාත් කිරීම හා සේව්‍යයන් විසින් වැරදි ගිණුම් වලට සාමාජික දායක මුදල් බැර කිරීමේ අවදානමින් සම්පූර්ණයෙන්ම මුදා ගැනීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථයක් වී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රථමයෙන්ම සේවකයන්ගේ හා සේව්‍යයන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, ඉන් පසුව සාමාජිකයින්ගේ මහපටැඟිලි සළකුණු ලබාගනු ලැබේ.

"සී" බාණ්ඩයට අයත් (සේවකයන් 150 ට අඩු) සේවා ස්ථානවල සේවකයින්ගේ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන් විසින් RR 1, RR 2 සහ RR 3 පෝරම මගින් රැස්කිරීම කරනු ලැබේ. මෙම පෝරම සේවකයා විසින් පිරවිය යුතු අතර, සේව්‍යයා විසින් සහතික කළ යුතු වේ. "සී3" බාණ්ඩයට අයත් (සේවකයන් 150 ට වැඩි) සේවා ස්ථානවල සේවකයින්ගේ තොරතුරු සංයුක්ත තැටි (CD), RR 2 සහ RR 3 යන පෝරම මගින් රැස්කරනු ලැබේ. සියළුම සේව්‍යයින්ගේ තොරතුරු RR 4 පෝරම මගින් සැපයිය යුතු වේ.

**සක්‍රීය සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, සේවා ස්ථානවලට බඳවා ගන්නා සෑම නව සේවකයකුම තම ජාතික හැඳුනුම්පතට අදාළ නම හා අංකයට අනුව ලියාපදිංචි කිරීම හා ඔවුන් වෙනුවෙන් මාසික දායක මුදල් බැර කිරීම කළයුතු බව සේව්‍යයන්ට මෙයින් දන්වා සිටිනු ලැබේ.**

මෙම ජාතික ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ගැනීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අප අපේක්ෂා කරමු.

මේ ව්‍යාපෘතිය පිළිබඳව ඔබට වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය වුවහොත්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මිය (011-2477551) හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ එස්. ජයවර්ධන මහතා (011-2368909) ඇමතිය හැකිය.